**ඔබ්සවර් ජොබ්ස් (පුද්ගලික) සමාගම - 2017**

**---------------------------------------------------------------------------**

ඔබ්සවර් ජොබ්ස් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

-----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව (කු ම ප අ සඳහා ශ්‍රී ලං මු වා ප්‍ර) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1** **මතය**

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ඔබ්සවර් ජොබ්ස් (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (කුමපඅ සඳහා ශ්‍රීලංමුවප්‍ර) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1** **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවය පිළිබඳ වාර්තාව**

------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියෙහි අවශ්‍ය පරිදි පහත සඳහන් කරුණු දක්වමි.

අ මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමාකිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

ආ. - විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.1.2** **සමාගමේ අඛණ්ඩ පැවැත්ම**

------------------------------------

අඛණ්ඩ ව්‍යාපාර අලාභ, ඍණාත්මක කාරක ප්‍රාග්ධනය සහ ඍණාත්මක ණය ගෙවීම් ආන්තිකය හේතුවෙන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2018 පෙබරවාරි 15 දින එහි මෙහෙයුම් නවතා දැමීමට තීරණය කර තිබුණි. එම නිසා, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම උපකල්පනය භාවිතා කර නොතිබුණි.

**2.2** **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

------------------------------------------------------------------------------

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 පෙබරවාරි 15 දින සමාගම වසා දැමීමට තීරණය කර තිබුණි. කෙසේවුවද, 2018 අගෝස්තු 31 දින වන විට ද, 2007 අංක 07 දරන සමාගම් පනතේ320(1) වගන්තිය ප්‍රකාර ස්වේච්ඡාවෙන් වසා දැමීම සඳහා යෝජනාවක් සම්මත කර නොතිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

---------------------------

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.6,008,716 ක බදු පූර්ව ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.4,613,969 ක බදු පූර්ව ශුද්ධ අලාභයක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,394,747 ක පිරිහීමක් දැක්වුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉපයූ ආදායම අඩුවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපෑ හේතුව වී තිබුණි.

**3.2 අගය එකතුවීම**

සමාගමේ මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණයේ දී, සේවක වැටුප්, රජයේ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු 2016 වර්ෂය සඳහා අගය එකතුවීම රු.836,826 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා එය රු.521,998 ක ඍණාත්මක අගයක් විය. එම නිසා, පසුගිය වර්ෂයට සාපේක්ෂව අගය එකතුවීම සියයට 162 න් පහළ ගොස් තිබුණි.

**3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**
**කාරක ප්‍රාග්ධන කළමනාකරණය සහ ණය ගෙවීමේ හැකියා ආන්තිකය**

සමාගමේ ජංගම වත්කම් සහ ජංගම වගකීම් තත්ත්වය විශ්ලේෂණය කිරීමේ දී, 2015 සිට කාරක ප්‍රාග්ධනය අඛණ්ඩ ඍණාත්මක අගයක් ගෙන තිබුණු අතර පසුගිය වර්ෂයේ රු.4,745,481 ක ඍණාත්මක අගය සමග සැසඳීමේ දී සමාලෝචිත වර්ෂය අවසානයට එය රු.10,622,685 ක ඍණාත්මක අගයක් විය. එබැවින්, සමාගමේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය ඉතා දුර්වල මට්ටමක වූ බව හෙළිදරව් විය. එසේම, 2016 වර්ෂයේ රු.7,119,229 ක ඍණාත්මක ණය ගෙවීමේ ආන්තිකය සමාලෝචිත වර්ෂයේ දී රු.13,122,685 ක් තෙක් වර්ධනය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ සිදුකෙරේ.

(අ) සමාගමට රු.65,000 ක ආදායමක් පමණක් ඉපයීමට හැකි වුවද, සමාලෝචිත වර්ෂය තුළ වැටුප් සහ වේතන වශයෙන් සමාගම රු.5,443,883 ක් ගෙවා තිබුණි.

(ආ) ස්ථාපිත කරන ලද අරමුණු ළඟා කරගැනීම වෙනුවෙන් සමාගමේ කාර්යයන් ක්‍රියාත්මක නොකිරීම නිසා සමාගමට එහි වියදම් මූල්‍යායනය කිරීම සඳහා සම්පූර්ණයෙන්ම මව් සමාගම මත රඳීමට සිදු වී තිබුණි. එම නිසා, 2017 දෙසැම්බර් 31 දින වන විට මව් සමාගමට රු.10,695,637 ක් ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ) දේශීය සහ අන්තර්ජාතික වශයෙන් සංවිධාන සහ පුද්ගලයින්ට මානව සම්පත් සේවා සැපයීම සමාගමේ වාර්තමාන අරමුණු විය. කෙසේවුවද, මෙහෙයුම් වර්ධනයක් සිදු නොවීම නිසා සහ 2016 වර්ෂයේ සමාගමේ ආදායම රු.1,686,480 ක සිට 2017 වර්ෂයේ දී රු.65,000 ක් දක්වා කැපීපෙනෙන ලෙස අඩුවීම නිසා අධ්‍යක්ෂ මණ්ඩලය සමාගම විසුරුවා හැරීමට තීරණය කර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාර සමාගම ආරම්භයේ සිටම සංයුක්ත සැලැස්මක්, වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සහ අයවැයක් පිළියෙල කර නොතිබුණි.